# 2017-02-21 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණ

**01. මොරගහකන්ද - කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය නිසා බලපෑමට ලක් වන ඉඩම් හිමියන්ට ගෙවනු ලබන අමතර වන්දි මුදල ගෙවීම කඩිනම් කිරීම - (විෂය අංක 09)**

මොරගහකන්ද - කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය නිසා බලපෑමට ලක්වන පවුල් සඳහා ඔවුන්ගෙන් අත් කරගනු ලබන ඉඩම්වල තක්සේරු වටිනාකමට අමතරව 50%ක වන්දි මුදලක්, 2016-2019 වසර 04ක කාල පරිච්ඡේදය තුළ කොටස් වශයෙන් ගෙවීම පිණිස අමාත්‍ය මණ්ඩල අනුමැතිය දැනටමත් ලබා දී තිබේ. ජලාශයට යටවන ඉඩම්හිමියන්ට ඇති වී තිබෙන දුෂ්කරතා සම්බන්ධයෙන් ඉදිරිපත්ව ඇති කරුණු සැලකිල්ලට ගෙන, එම අමතර වන්දි මුදල, 2017-2018 දෙවර්ෂය තුළ සම්පූර්ණයෙන්ම ගෙවා නිම කිරීම පිණිස මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යතුමා වශයෙන් අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**02. මහජන ආරක්ෂාව තර කිරීම හා ත්‍රස්තවාදී මර්දන කටයුතු ශක්තිමත් කිරීම වෙනුවෙන් ජපානයෙන් ප්‍රදාන ආධාර ලබා ගැනීම - (විෂය අංක 11)**

ජපානය සහ ශ්‍රී ලංකාව අතර ද්විපාර්ශ්වික සම්බන්ධතා ශක්තිමත් කරගැනීම පිණිස ජපාන රජය විසින් වාර්ෂිකව විවිධ ආධාර යෝජනා ක්‍රම යටතේ ශ්‍රී ලංකාව වෙත ප්‍රදාන ආධාර සලසා දෙනු ලබයි. ඒ අනුව, ශ්‍රී ලංකාවේ මහජන ආරක්ෂාව වැඩිදියුණු කිරීම පිණිස සහ ත්‍රස්ත විරෝධී ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීම පිණිස 2016/2017 මූල්‍ය වර්ෂය තුළ ජපාන යෙන් මිලියන 250ක (රුපියල් මිලියන 327ක් පමණ) වටිනාකමකින් යුතු ජපාන නිෂ්පාදන, ව්‍යාපෘති නොවන ප්‍රදාන ආධාර යටතේ සලසා දීමට ජපාන රජය විසින් එකඟතාව පළ කරනු ලැබ ඇත. ඒ අනුව, එකී ජපාන යෙන් මිලියන 250ක ප්‍රදාන ආධාර ලබාගැනීම සඳහා ජපාන රජය සමඟ හුවමාරු පත්‍ර අත්සන් කිරීම පිණිස ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වශයෙන් ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**03. ශ්‍රී ලංකාවේ මූල්‍ය ක්ෂේත්‍රය නවීකරණ සඳහා මූල්‍ය අංශය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම - (විෂය අංක 13)**

ශ්‍රී ලංකාවේ මූල්‍ය ක්ෂේත්‍රය තුළ අත්‍යවශ්‍යයෙන්ම සිදු කළ යුතු ප්‍රතිසංස්කරණ හඳුනාගනු ලැබ ඇති අතර, මූල්‍ය ක්ෂේත්‍රයේ සංවර්ධනය ඉලක්ක කර ගනිමින් එම ප්‍රතිසංස්කරණ අතුරින් කිහිපයක් 2017 - 2022 කාලය තුළ 'මූල්‍ය ක්ෂේත්‍රය නවීකරණ ව්‍යාපෘතිය' මඟින් ක්‍රියාවට නැංවීමට ශ්‍රී ලංකා රජය විසින් සැලසුම් කරනු ලැබ ඇත. තෝරාගත් මධ්‍යම මට්ටමේ ප්‍රතිසංස්කරණ සඳහා මූල්‍යමය සහාය දැක්වීම, නියාමන ආයතනවල ආයතනික ධාරිතාව ශක්තිමත් කිරීම හා එම ක්ෂේත්‍රයේ යටිතල පහසුකම් නවීකරණය කිරීම සහ ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීම හා අධීක්ෂණය කිරීම යන සංරචක තුන (03) යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවෙනු ඇත.

ඒ අනුව, මුදල් අමාත්‍යාංශය, ශ්‍රී ලංකා මහ බැංකුව, සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය යන ආයතන විසින් 2017 - 2022 කාලය තුළ 'මූල්‍ය ක්ෂේත්‍රය නවීකරණ ව්‍යාපෘතිය' ක්‍රියාත්මක කිරීමටත්, ඒ සඳහා ලෝක බැංකුවේ ජාත්‍යන්තර සංවර්ධන සමායතනයෙන් (IDA) ඇමරිකන් ඩොලර් මිලියන 75කට සමාන විශේෂ හර ගැනුම් හිමිකම් (SDR) ව්‍යවහාර ණය මුදලක් ලබාගැනීමටත් ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වශයෙන් ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**04. වනඅලින්ගෙන් සිදු වන හානි සඳහා වන්දි ගෙවීමේ ක්‍රමය යටතේ පුද්ගල ජීවිත හානි සඳහා ගෙවනු ලබන වන්දි මුදල ඉහළ නැංවීම -(විෂය අංක 15)**

වනඅලි පහරදීමක් හේතුවෙන් පුද්ගල මරණයක් සිදුවීම නිසා එම තැනැත්තාගෙන් යැපෙන්නන් අසරණ තත්ත්වයට පත්වේ. එවැනි අවස්ථාවක, මියගිය පුද්ගලයාගෙන් යැපෙන්නන් වෙත සාධාරණ වන්දි මුදලක් ගෙවීමෙන් යම් තරමක හෝ සහනයක් සැලසේ. එසේ හානියට පත් වන පුද්ගලයන් වෙනුවෙන් සහ නිවාස හා දේපළ හානි සඳහා ගෙවනු ලබන වන්දි මුදල් සීමාවන් ඉහළ නැංවීමට අමාත්‍ය මණ්ඩලය විසින් මෑතක දී අනුමැතිය ලබා දෙනු ලැබ තිබේ. වනඅලින්ගෙන් සිදුවන හානි සඳහා වන්දි ගෙවනු ලබන ක්‍රමවේදය තවදුරටත් සංශෝධනය කරමින්, වනඅලි පහරදීමක් හේතුවෙන් සිදුවන පුද්ගල මරණයක් හෝ පූර්ණ බෙලහීනතාවක් සඳහා ගෙවනු ලබන වන්දි මුදල රුපියල් 200,000/- සිට රුපියල් 500,000/-ක් දක්වා ඉහළ නැංවීම පිණිස තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍ය ගාමිණී ජයවික්‍රම පෙරේරා මැතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**05. ස්වාභාවික සම්පත් සංරක්ෂණය හා වනජීවී - මිනිස් සංඝිදියාව ගොඩනැඟීම සඳහා ශ්‍රී ලංකා බාලදක්ෂ ව්‍යාපාරයෙහි සහාය ලබාගැනීම - (විෂය අංක 16)**

ස්වාභාවික සම්පත් සංරක්ෂණය හා වනසත්ත්ව - මිනිස් සංඝිදියාව පිළිබඳ ප්‍රජාව දැනුම්වත් කිරීමේ කාර්යයට ශ්‍රී ලංකා බලදක්ෂ ව්‍යාපාරය හා ශ්‍රී ලංකා බාලදක්ෂිකා ව්‍යාපාරය දායක කරගැනීම සඳහා වන පුහුණු වැඩසටහනක්, අධ්‍යාපන දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධව වසර තුනක (03) කාලයක් තුළ ශ්‍රී ලංකා වනජීවී භාරයේ රන්දෙණිගල පුහුණු මධ්‍යස්ථානයේ පවත්වාගෙන යාම පිණිස තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍ය ගාමිණී ජයවික්‍රම පෙරේරා මැතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**06. කම්කරු විනිශ්චය සභා ඉදිරියේ පාර්ශ්වකරුවන් වෙනුවෙන් නියෝජනය කිරීමට සහ පෙනී සිටීමට ඇති අයිතිය පුළුල් කිරීම සඳහා කාර්මික ආරවුල් පනත සංශෝධනය කිරීම - (විෂය අංක 18)**

කාර්මික ආරවුල් පනතේ විධිවිධාන යටතේ ස්ථාපිත කරනු ලැබ ඇති කම්කරු විනිශ්චය සභාවන්හි වගකීම වනුයේ පිළිගත් යුක්තිසහගත හා සාධාරණ මූලධර්ම යටතේ වේගවත් සහ අඩු වියදම් සහිත යන්ත්‍රණයක් මඟින් කාර්මික ආරවුල් නිරවුල් කිරීමයි. සාමාන්‍ය සේවක ප්‍රජාවන්ට පහසුවෙන් සේවා ලබා ගත හැකි විනිශ්චය සභාවක් වශයෙන් කටයුතු කිරීම මෙමඟින් අපේක්ෂා කරනු ලැබුවද, නීතිඥයින් නොවන නියෝජිතයින්ට පාර්ශ්වකරුවන් වෙනුවෙන් පෙනී සිටීමට ඉඩ නොදෙමින් ඇතැම් කම්කරු විනිශ්චය සභා සභාපතිවරුන් විසින් සිදු කරනු ලැබ ඇති දෝෂ සහගත අර්ථනිරූපණ හේතුවෙන් සාමාන්‍ය සේවා නියුක්තිකයන්ට අගතියක් සිදු වී ඇති බව හඳුනාගෙන තිබේ.

ඒ අනුව, නීතිඥයින් නොවන අයට, කම්කරු විනිශ්චය සභා ඉදිරියේ පාර්ශ්වකරුවන් නියෝජනය කිරීමට සහ පෙනී සිටීමට ඉඩ සැලසීමටත්, කම්කරු කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියා ඉදිරියේ පවත්වනු ලබන පරීක්ෂණ කටයුත්තකදී නීතිඥයකු පෙනී සිටීම වළකනු ලබන, දැනට පනතේ පවත්නා විධිවිධාන ඉවත් කිරීමටත්, කම්කරු විනිශ්චය සභාවකින් දෙනු ලබන නියෝගයක් සේවා යෝජකයන් විසින් පිළිනොපදින අවස්ථාවකදී ඒ පිළිබඳ ක්‍රියාමාර්ග ගැනීම සඳහා දැනට කම්කරු කොමසාරිස්වරයා සතුව පවතින බලය කම්කරු විනිශ්චය සභා සභාපතිවරුන් වෙත ලබා දීමටත් හැකි වන පරිදි කාර්මික ආරවුල් පනතට සුදුසු සංශෝධන කෙටුම්පත් කිරීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක වෙත උපදෙස් දීම පිණිස කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය ඩබ්ලිව්.ඩී.ජේ.සෙනෙවිරත්න මැතිතුමා සහ අධිකරණ අමාත්‍ය (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මැතිතුමා ඉදිරිපත් කළ ඒකාබද්ධ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

07. **ශ්‍රී ලංකා ජාතික රෝහල සියලු පහසුකම්වලින් සමන්විත නවීන රෝහලක් ලෙස සංවර්ධනය කිරීම - (විෂය අංක 20)**

මෙරට සෞඛ්‍ය සත්කාරක සේවා පද්ධතියේ විශිෂ්ටතම මධ්‍යස්ථානය ලෙස සැලකිය හැකි, ඇඳන් 3,382කින් සමන්විත ශ්‍රී ලංකා ජාතික රෝහල දීර්ඝකාලීන සංවර්ධන සැලසුමක් අනුගමනය කරමින් අංග සම්පූර්ණ නවීන රෝහලක් වශයෙන් සංවර්ධනය කිරීම කාලෝචිත වේ. මෙම සංවර්ධන ක්‍රියාදාමයේ කොටසක් වශයෙන්, කඩිනමින් සම්පූර්ණ කළ යුතු බවට හඳුනා ගනු ලැබ ඇති පහත සඳහන් අවශ්‍යතා ඉටු කිරීම පිණිස සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍ය (වෛද්‍ය) රාජිත සේනාරත්න මැතිතුමා ඉදිරිපත් කළ යෝජනා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

- රෝගීන්ට හා කාර්යමණ්ඩලයට පුළුල් පහසුකම් සැලසෙන පරිදි පැරණි වික්ටෝරියා ගොඩනැගිල්ල හා බණ්ඩාරනායක ගොඩනැගිල්ල නවීකරණය කිරීම.
- බාන්ස් පෙදෙසෙහි පිහිටි වෛද්‍යවරුන්ගේ නිල නිවාස සහ අංක 93හි පිහිටි හෙද නිල නිවාස නවීකරණය කිරීම.

08. **කොළඹ ද සොයිසා කාන්තා රෝහලේ නවීන නවජ (Neonatal) ළදරු මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම - (විෂය අංක 21)**

කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයට යාබදව, කොළඹ නගර මධ්‍යයේ පිහිටා ඇති 'ද සොයිසා කාන්තා රෝහල' මඟින් මාතෘ, ප්‍රසව හා නාරිවේද, මඳසරු බව, ළදරු සත්කාර සහ පවුල් සැලසුම් සම්බන්ධ වෛද්‍ය සේවාවන් සලසා දෙනු ලැබේ. එසේම කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය උපාධි අපේක්ෂයින් සහ පශ්චාත් උපාධි අපේක්ෂකයින් පුහුණු කිරීම සඳහා ද එම රෝහල දායක වේ. ද සොයිසා කාන්තා රෝහලේ සිදුවන දරු උපත් සංඛ්‍යාව මෙන්ම සංකූලතා හේතුවෙන් වෙනත් රෝහල්වලින් මාරු කර එවනු ලබන මව්වරුන් හා ළදරුවන් සංඛ්‍යාවද ඉහළ අයගයක් ගන්නා බැවින්, එම රෝහලේ නොමේරූ ළදරු ඒකකය (PBU) සහ විශේෂ සත්කාර ළදරු ඒකකය (SCBU) වැඩිදියුණු කිරීම සහ පුළුල් කිරීම ප්‍රමුඛ අවශ්‍යතාවක්ව පවතින අතර ඒ සඳහා අරමුදල් සලසා ගැනීමට දැනටමත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දෙනු ලැබ තිබේ.

ඒ අනුව, ද සොයිසා කාන්තා රෝහලෙහි නවජ ළදරු සත්කාර සහ විශේෂඥ ළදරු සත්කාරක සේවාවන්ගේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා නවජ ළදරු විශේෂඥතා මධ්‍යස්ථානයක් ප්‍රංශ රජයේ ආධාර යටතේ එම රෝහල තුළ ඉදි කිරීම පිණිස සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍ය (වෛද්‍ය) රාජිත සේනාරත්න මැතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**09. ණය තොරතුරු සේවා සැපයුම්කරුවන් පිළිබඳ පනත් කෙටුම්පත - (විෂය අංක 25)**

ණය අයදුම්කරුගේ පෙර ණය ලබාගැනීම් පිළිබඳ විස්තර පදනම් කරගනිමින් වඩා හොඳ තීරණවලට එළඹීමේ හැකියාව මගින් ණය ආයෝජනවල තත්ත්වය වැඩිදියුණු කරගත හැකිය. එසේම ණය ගෙවීම පැහැර හැරීමේ ප්‍රවණතාවද එමගින් අවම කරනු ලබන හෙයින් ණය සඳහා වන වියදම අඩු වන අතර, එහි ප්‍රතිලාභය ණය ගැනුම්කරුවන් වෙත ලබා දිය හැකි වේ.

දැනට ශ්‍රී ලංකාවේ ණය තොරතුරු සැපයීමට අධිකාරි බලයලත් එකම ආයතනය ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය වන අතර, පෞද්ගලික ණය තොරතුරු සැපයුම්කරුවන් මගින් වෙළඳ පොළ ආර්ථිකය සඳහා ඇති කළ හැකි සාධනීය බලපෑම රජය විසින් හඳුනාගනු ලැබ තිබේ. ඒ අනුව, නිවැරදි ණය තොරතුරු රැස් කිරීමේ හා බෙදා හැරීමේ කාර්යය සඳහා ණය තොරතුරු සේවා සැපයුම්කරුවන් වෙත බලපත්‍ර නිකුත් කිරීමටත්, ඔවුන් නියාමනය කිරීමට හා අධීක්ෂණය කිරීමට අදාළව විධිවිධාන සැලසීමටත් සකස් කරනු ලැබ ඇති 'ණය තොරතුරු සේවා පනත් කෙටුම්පත', ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව අනුමැතිය පිණිස පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමටත් මුදල් අමාත්‍ය රවි කරුණානායක මැතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**10. රජය සතු විශේෂ යටිතල පහසුකම් සමාගමක් (SIFCO) මගින් අත්‍යවශ්‍ය යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා අරමුදල් සැපයීම - (විෂය අංක 26)**

කාර්යක්ෂම සහ ඵලදායී මෙහෙයුම් යොදාගනිමින් වගකීම් සහගතව අරමුදල් කළමනාකරණය කරමින් රටෙහි සංවර්ධනය වේගවත් කිරීමට දායක වන ප්‍රධාන යටිතල පහසුකම් ව්‍යාපෘතිවල ආයෝජනය කිරීම සඳහා මූලිකත්වය දීම රජයේ ප්‍රතිපත්තියයි. ඒ අනුව, හඳුනාගත් අධිවේගී මාර්ග ව්‍යාපෘතිවල ප්‍රශස්ත කාර්යක්ෂමතාවකින් ආයෝජනය කිරීමට ඉඩ සැලසෙන පරිදි, ශ්‍රී ලංකා රජයට සහ මාර්ග සංවර්ධන අධිකාරියට අයත්, වගකීමෙන් සීමිත පොදු සමාගමක් ලෙස 'විශේෂ යටිතල පහසුකම් සමාගම' (SIFCO) ස්ථාපනය කිරීමටත්, දැනට ඉදි කරනු ලැබ ඇති දක්ෂිණ, පිටත වටරවුම, කොළඹ - කටුනායක යන අධිවේගී මාර්ගවල, ඉදි කෙරෙමින් පවතින හා අනාගතයේ ඉදි කෙරෙන අධිවේගී මාර්ග ව්‍යාපෘතිවල වත්කම් එම සමාගම වෙත පැවරීමටත්, එම වත්කම් පදනම යොදාගනිමින් ආයෝජකයින්ගෙන් ප්‍රාග්ධනය ඉපයීමට හෝ එම වත්කම් ඇපයක් වශයෙන් යොදාගනිමින් නව අධිවේගී මාර්ග ඉදි කිරීම සඳහා ණය ලබාගැනීමටත් මුදල් අමාත්‍ය රවි කරුණානායක මැතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**11. ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරනු ලබන සුරැකුම්පත් සඳහා වන යුරෝ-නිෂ්කාශන ක්‍රමය (Euro - clearing) - (විෂය අංක 27)**

විදේශීය ආයෝජකයන් වැඩි වශයෙන් ආකර්ෂණය කරගැනීම සඳහා භාණ්ඩාගාර බැඳුම්කර වෙළඳ පොළ පහසුකම් ඉහළ නැංවීම අවශ්‍ය වේ. රජයේ සුරැකුම්පත් විදේශ ආයෝජකයන් අතර ජනප්‍රිය කරවීමටත්, ගනුදෙනුවල සංකීර්ණත්වය අඩු කිරීමටත්, පිරිවැය අවම කිරීමටත් විවෘත සහ නම්‍යශීලී පහසුකමක් ලෙස යුරෝ - නිෂ්කාශන ක්‍රමය (Euroclear) උපකාරී වේ. ඒ අනුව, විවිධාංගීකරණය වූ ආයෝජන පදනමක් නිර්මාණය කරමින් විදේශීය ආයෝජකයන් හට රජයේ සුරැකුම්පත් වෙළඳ පොළට ඍජු හා බාධාවකින් තොර ප්‍රවේශයක් සලසාදීමේ අරමුණින් ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් සඳහා යුරෝ - නිෂ්කාශන (Euroclear) පහසුකම ලබාගැනීමට අවශ්‍ය දේශීය නීතිමය හා නියාමන රාමුවක් ස්ථාපනය කිරීම පිණිස මුදල් අමාත්‍ය රවි කරුණානායක මැතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**12. 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සකස් කරන ලද නියෝග - (විෂය අංක 28)**

ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (Institute of Certified Management Accountant of Sri Lanka) සාමාජිකයින්ට ද සමාගම් ලේකම්වරුන් ලෙස ලියාපදිංචි වීමට අවසර ලබා දෙමින්, 2007 අංක 07 දරන සමාගම් පනතේ 527 වගන්තිය යටතේ තමන් විසින් සාදන ලද 2016-12-20 දිනැති, 1998/11 අංක දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 'සමාගම් (ලේකම්වරයන් පිළිබඳ) නියෝග', අනුමැතිය පිණිස පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම පිණිස කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය රිෂාඩ් බදියුදීන් මැතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**13. නාගරික ඝන අපද්‍රව්‍ය දහනය කිරීම මඟින් නිපදවනු ලබන විදුලිය මිල දී ගැනීම සඳහා අය ක්‍රමයක් හඳුන්වාදීම - (විෂය අංක 29)**

කැරදියාන සහ මුතුරාජවෙල යන ප්‍රදේශවල ස්ථාපිත කරනු ලැබීමට දැනටමත් අනුමැතිය ලබා දී ඇති නාගරික ඝන අපද්‍රව්‍ය පිරිසැකසුම් මධ්‍යස්ථාන සහ ඉදිරියේදී ස්ථාපිත කරනු ලබන එවැනි නාගරික ඝන අපද්‍රව්‍ය පිරිසැකසුම් මධ්‍යස්ථාන මඟින් කසළ දහනය කිරීමෙන්

උත්පාදනය කරනු ලබන විදුලිය මිලට ගැනීම සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් නියම කරනු ලැබ ඇති අයක්‍රමය (Feed in Tariff) ක්‍රියාත්මක කිරීම පිණිස මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක මැතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**14. රත්නපුර දිස්ත්‍රික් සංස්කෘතික මධ්‍යස්ථානය ඉදි කිරීම සඳහා රත්නපුර, නව නගරයෙන් ඉඩම් කොටසක් ලබා දීම - (විෂය අංක 31)**

රත්නපුර දිස්ත්‍රික් සංස්කෘතික මධ්‍යස්ථානය පිහිටුවීම සඳහා, නාගරික සංවර්ධන අධිකාරිය සතු, රත්නපුර, නව නගරයෙහි පිහිටි ෆාම් ගාඩ්න් වත්ත නමැති ඉඩමෙන් අක්කර 01ක ඉඩම් කොටසක්, රත්නපුර දිස්ත්‍රික් ලේකම් වෙත පවරා දීම පිණිස මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක මැතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**15. ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ සබරගමු පළාත් කාර්යාලය ඉදි කිරීම සඳහා රත්නපුර, නව නගරයේ පිහිටි ඉඩම් කොටසක් ලබා දීම - (විෂය අංක 33)**

ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ සබරගමු පළාත් කාර්යාලය ඉදි කිරීම සඳහා, නාගරික සංවර්ධන අධිකාරිය සතු, රත්නපුර, නව නගරයෙහි පිහිටි ෆාම් ගාඩ්න් වත්ත නමැති ඉඩමෙන් පර්චස් 20ක ඉඩම් කොටසක් රත්නපුර ප්‍රාදේශීය ලේකම් මඟින් ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව වෙත පවරා දීම පිණිස මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක මැතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**16. ජාතික ප්‍රජා ජලසම්පාදන දෙපාර්තමේන්තුවේ රත්නපුර දිස්ත්‍රික් කාර්යාලය ඉදි කිරීම සඳහා රත්නපුර, නව නගරයේ පිහිටි ඉඩම් කොටසක් ලබා දීම - (විෂය අංක 34)**

ජාතික ප්‍රජා ජලසම්පාදන දෙපාර්තමේන්තුවේ රත්නපුර දිස්ත්‍රික් කාර්යාලය ඉදි කිරීම සඳහා, නාගරික සංවර්ධන අධිකාරිය සතු, රත්නපුර, නව නගරයෙහි පිහිටි ෆාම් ගාඩ්න් වත්ත නමැති ඉඩමෙන් රූඩ් 01 පර්චස් 29ක ඉඩම් කොටසක්, රත්නපුර ප්‍රාදේශීය ලේකම් මඟින් ජාතික ප්‍රජා ජලසම්පාදන දෙපාර්තමේන්තුව වෙත පවරා දීම පිණිස මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක මැතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**17. හෝමාගම, පිටිපන, මාහේනවත්ත ඉඩමෙන් විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය හා මොරටුව විශ්වවිද්‍යාලය සඳහා ඉඩම් ලබා දීම - (විෂය අංක 35)**

විද්‍යා හා තාක්ෂණ ආශ්‍රිත සංවර්ධන කටයුතු නංවා ලීම සඳහා සහ ඒ ආශ්‍රිත ආයතන ස්ථාපිත කිරීම පිණිස හෝමාගම, පිටිපන, මාහේනවත්ත ප්‍රදේශයේ පිහිටි හෙක්ටයාර 34ක පමණ ඉඩම් අත්පත් කරගැනීමට නාගරික සංවර්ධන අධිකාරිය විසින් කටයුතු කරනු ලැබ ඇත. එම ඉඩම්වලින් අක්කර 46ක පමණ වපසරියකින් යුත් ඉඩම් කොටස්, රජයේ ප්‍රධාන තක්සේරුකරු විසින් තක්සේරු කරනු ලබන වටිනාකම ගෙවීමට යටත්ව, විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය හා මොරටුව විශ්වවිද්‍යාලය යන ආයතන වෙත පවරා දීම පිණිස මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක මැතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**18. ධීවර ප්‍රජාව සඳහා ජීවනෝපාය සංවර්ධන හා දිළිඳුකම පිටුදැකීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම - (විෂය අංක 36)**

වෙරළබඩ හා මිරිදිය ධීවර ක්ෂේත්‍රයන්හි නියුතු ධීවර ප්‍රජාවගේ ජීවන තත්ත්වය උසස් කිරීම පිණිස ජීවනෝපාය සංවර්ධන සහ නිවාස ඉදිකිරීම් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා 2017 වර්ෂය වෙනුවෙන් රුපියල් මිලියන 1,200ක ප්‍රතිපාදන ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය වෙත වෙන් කරනු ලැබ ඇත. ඒ අනුව, ඉහළ ප්‍රමුඛතාවක් ලබා දී ක්‍රියාත්මක කළ යුතු බවට අමාත්‍යාංශය විසින් හඳුනාගනු ලැබ ඇති ව්‍යාපෘති 30ක්, එම ප්‍රතිපාදන උපයෝගි කරගනිමින්, පෞද්ගලික අංශයේද සහාය ඇතිව ක්‍රියාත්මක කිරීම පිණිස ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය මහින්ද අමරවීර මැතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**19. 2013 අංක 2 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනතට සංශෝධන - (රැඳවූවන්ගේ අයිතිවාසිකම් - නීතිඥවරයෙකු වෙත ප්‍රවේශ වීම) - (විෂය අංක 38)**

පොලිස් අත්අඩංගුවේ පසුවන සැකකරුවෙකුගේ අයිතිවාසිකම් තවදුරටත් පුළුල් කිරීමේ කාර්යය සඳහා 2013 අංක 2 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනතට සංශෝධන ව්‍යවස්ථා කෙටුම්පත් කිරීම පිණිස නීති කෙටුම්පත් සම්පාදක වෙත උපදෙස් දීමට 2017-01-10

දින පැවැති සිය රැස්වීමේදී අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දෙනු ලැබ ඇත. ඒ අනුව, නීති කෙටුම්පත් සම්පාදක විසින් කෙටුම්පත් කරනු ලැබ ඇති, නීතිපතිතුමා විසින් නිෂ්කාශනය ලබා දෙනු ලැබ ඇති, 'අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත' ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව අනුමැතිය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමටත් අධිකරණ අමාත්‍ය (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මැතිතුමා ඉදිරිපත් කළ යෝජනා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**20. ඉදි කිරීම් යන්ත්‍රෝපකරණ ක්‍රියාකරුවන් පුහුණු කිරීමේ මධ්‍යස්ථානයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම - (විෂය අංක 40)**

ඉදි කිරීම් ව්‍යාපෘතීන්හි උපරිම ඵලදායිතාව ලබාගැනීම සඳහා පුහුණුව ලත් යන්ත්‍රෝපකරණ ක්‍රියාකරුවන් විසින් ඉදි කිරීම් යන්ත්‍රෝපකරණ ඵලදායී අයුරින් ක්‍රියාත්මක කරවීම අවශ්‍ය වේ. 1982 වසරේදී අනුරාධපුරයේ, ගල්කුලම ප්‍රදේශයේ පිහිටුවනු ලැබ ඇති, ඉදි කිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය යටතේ ක්‍රියාත්මක වන ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ ක්‍රියාකරුවන් පුහුණු කිරීමේ මධ්‍යස්ථානය, ඉදි කිරීම් කර්මාන්තය සඳහා අවශ්‍ය මිනිස් බලය සපයනු ලබන ප්‍රමුඛතම ආයතනයකි. දේශීය ඉදි කිරීම් කර්මාන්තයේ තිරසර වර්ධනයත්, දේශීය හා විදේශීය ඉදි කිරීම් කර්මාන්තයේ නැඟී එන පුහුණු මිනිස් බල අවශ්‍යතාව සපුරාලීමත් සඳහා එම ඉදි කිරීම් යන්ත්‍රෝපකරණ ක්‍රියාකරුවන් පුහුණු කිරීමේ මධ්‍යස්ථානයේ සිදු කළ යුතු යටිතල පහසුකම් සංවර්ධනය කිරීම් සවිස්තර සැලැස්මක් යටතේ හඳුනාගැනීම පිණිස නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය සජිත් ප්‍රේමදාස මැතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**21. ජපානයේ කෝබෙ නාගරික රාජ්‍යයේ වරාය හා නාගරික ව්‍යාපෘති කාර්යාංශය සහ කොළඹ වරාය අතර අන්‍යෝන්‍ය ගිවිසුම් ප්‍රකාශයක් අත්සන් තැබීම - (විෂය අංක 41)**

ජපානයේ, කෝබෙ නගරයේදී පැවැත්වීමට නියමිත 'ජාත්‍යන්තර වරායන් පිළිබඳ සමුළුව' සඳහා සහභාගී වීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත ඇරියුම් ලැබී ඇත. මෙම සමුළුව ආසියානු කලාපයේ සමුද්‍රීය කටයුතු පිළිබඳ තොරතුරු හුවමාරු කරගැනීම සඳහා සුවිශේෂ අවස්ථාවක් වන අතර, එහි දී ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ ජපානයේ කෝබෙ නාගරික රජයේ වරාය සහ නාගරික ව්‍යාපෘති කාර්යාංශය අතර අන්‍යෝන්‍ය ගිවිසුමකට එළඹීම පිණිස වරාය හා නාවික කටයුතු අමාත්‍ය අර්ජුන රණතුංග මැතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**22. වතුකර ප්‍රජාව සඳහා නිවාස ඉදි කිරීම - එක් නිවාසයක් සඳහා වෙන් කරන මුදල රු.650,000.00 සිට රු.1,000,000.00 දක්වා වැඩි කිරීම -(විෂය අංක 42)**

කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාශයේ මෙහෙයවීම යටතේ ණය සහ ප්‍රදාන අධාර පදනම මත වැවිලි මානව සංවර්ධන භාරය මඟින් වතු සේවකයන්ගේ නිවාස සමුපකාර සමිති විසින් වතුකරයේ ප්‍රජාව සඳහා නිවාස ඉදි කෙරෙමින් පවතී. නිදන කාමර දෙකකින්, සාලයකින්, ආලින්දයකින්, මුළුතැන්ගෙයකින් හා නිවසට ඇඳුණු වැසිකිළියකින් සමන්විත එම එක් නිවසක් සඳහා 2014 වර්ෂයේදී සකස් කරන ලද ඇස්තමේන්තු අනුව, අමාත්‍යාංශය විසින් වර්තමානයේ වෙන් කරනු ලැබ ඇති මුදල රුපියල් 650,000/-කි. ගොඩනැඟිලි ඉදි කිරීම් ද්‍රව්‍යවල වර්තමාන මිල ගණන් සැලකිල්ලට ගැනීමේදී එම මුදල ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය වන අතර, සම්පූර්ණ නිවසක් ඉදි කරගැනීමට ප්‍රතිලාභීන්ට හැකියාව ලැබෙන පරිදි එක් නිවසක් සඳහා ඇස්තමේන්තුගත කර ඇති මුදල රුපියල් 650,000/- සිට රුපියල් 1,000,000/-ක් දක්වා වැඩි කිරීමටත්, එම මුදලින් රුපියල් 480,000/-ක් ආපසු අය නොකෙරෙන, ප්‍රදානයක් ලෙස ලබා දීමටත්, රුපියල් 520,000/-ක ඉතිරි මුදල වසර 15ක් තුළ ප්‍රතිලාභීන්ගෙන් අය කරගත හැකි වන පරිදි ණය මුදලක් ලෙස ලබා දීමටත්, නායයෑම් හේතුවෙන් පීඩාවට පත් පවුල් සඳහා සහ නායයාමට ලක්වීමේ අවදානමක් ඇති, සිය නිවාසවලින් ඉවත්වන ලෙස දැනුම් දෙනු ලැබ ඇති පවුල් සඳහා නිවාස ඉදි කරගැනීමට ලබා දෙන මුදල සම්පූර්ණයෙන්ම ප්‍රදානයක් ලෙස ලබා දීමටත් කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍ය පලනි දිගම්බරම් මැතිතුමා ඉදිරිපත් කළ යෝජනා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**23. ජාතික කාන්තා කොමිෂන් සභාව පිහිටුවීම - (විෂය අංක 43)**

ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා ඔවුන් බලගැන්වීම සඳහා කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය, ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය හා ජාතික කාන්තා කමිටුව යන ආයතන මැදිහත් වෙමින් ක්‍රියා කළද, කාන්තාවන්ට එරෙහිව වැඩිවෙමින් පවතින ප්‍රචණ්ඩ සිද්ධීන්ට ක්‍රියාකාරී ලෙස මැදිහත්ව විමර්ශනය කිරීමට හා අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට බලයක් මෙම ආයතන සතුව නොමැත. ඒ අනුව, කාන්තාවන්ගේ අභිවෘද්ධිය උදෙසා පියවර ගැනීම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහ කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ හිංසනයන් තුරන් කිරීම පිළිබඳ සම්මුතිය (CEDAW) මඟින් රජය වෙත පැවරී ඇති වගකීම සැලකිල්ලට ගෙන, ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ

අභිවෘද්ධිය උදෙසා ක්‍රියා කිරීම සඳහා 'ජාතික කාන්තා කොමිෂන් සභාවක්' පිහිටුවීම පිණිස කාන්තා හා ළමා කටයුතු අමාත්‍ය චන්ද්‍රානි බණ්ඩාර මැතිතුමිය ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

24. **පුස්සැල්ලාව සරස්වති මධ්‍ය මහා විද්‍යාලයේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම - (විෂය අංක 44)**

දහසක පමණ ශිෂ්‍ය පිරිසක් ඉගෙනුම ලබන පුස්සැල්ලාව සරස්වති මධ්‍ය මහා විද්‍යාලය, මධ්‍යම පළාතේ ගම්පොළ අධ්‍යාපන කලාපයට අයත්, වසර 100ක් පමණ පැරණි දෙමළ මාධ්‍ය පාසලකි. එම ප්‍රදේශයේ පිහිටි පාසල් අතුරින්, අධ්‍යාපන කටයුතුවල නිරත වතුකරයේ දරුවන්ට අවශ්‍ය පහසුකම් සහිත පාසලක් ලෙස දියුණු කළ හැකි විභවතාවක් සහිත පෝෂිත පාසල් කිහිපයකම කේන්ද්‍රීය පාසලද එය වේ. ඒ අනුව, ඇයේ දූදරුවන්ට සම අධ්‍යාපනික අවස්ථා ලබා දීම සඳහා වන ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට ගනු ලබන සුවිශේෂ පියවරක් ලෙස, පියවරක් ලෙස ඉන්දියානු රජයේ අනුග්‍රහය යටතේ මෙම විද්‍යාලයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ඉන්දීය ජනරජය අතර අවබෝධතා ගිවිසුමක් ඇති කරගැනීමටත්, එකී යටිතල පහසුකම් සංවර්ධන කටයුතු මධ්‍යම පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ සහයෝගය ඇතිව අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කිරීමටත් අධ්‍යාපන අමාත්‍ය අකිල විරාජ් කාරියවසම් මැතිතුමා ඉදිරිපත් කළ යෝජනා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

25. **මොරගොඩ ඇළ හා පන්සල අතුරු මාර්ගය පුනරුත්ථාපනය කිරීම - (විෂය අංක 48)**

නුවර හා ගාල්ල නගරවල උපායමාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 147ක ණය මුදලක් ජාත්‍යන්තර සංවර්ධන සමායතනය (IDA) විසින් සපයනු ලැබ ඇත. එම ණය මුදලින් කොටසක් උපයෝගී කරගනිමින් ගාල්ල ප්‍රදේශයේ මොරගොඩ ඇළ හා පන්සල අතුරු මාර්ගය පුනරුත්ථාපනය කිරීමට නියමිතය. ඒ අනුව, ඊට අදාළ කොන්ත්‍රාත්තුව, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශය පරිදි, රුපියල් 844,907,205.00ක වැට් රහිත මුදලකට සී/ස බිස්නස් ප්‍රමෝටර්ස් ඇන්ඩ් පාර්ට්නර්ස් ඉංජිනියරින් (පෞද්.) සමාගම [M/s Business Promoters & Partners Engineering (Pvt.) Ltd.] වෙත පිරිනැමීම පිණිස මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක මැතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**26. 2017-02-19 දින, කළුතර, කටුකුරුන්ද ප්‍රදේශය ආසන්න මුහුදේදී බෝට්ටුවක් පෙරළීමෙන් සිදු වූ අනතුරින් මියගිය හා තුවාල ලැබූ අය වෙනුවෙන් වන්දි ලබා දීම - (විෂය අංක 52)**

2017-02-19 දින, ආගමික කටයුත්තක් සඳහා ධීවර බෝට්ටු කිහිපයකින් බේරුවල සිට කළුතර දක්වා මුහුදු මාර්ගය ඔස්සේ ගමන් කරමින් සිටියදී, කළුතර, කටුකුරුන්ද ප්‍රදේශය ආසන්න මුහුදේදී එක් බෝට්ටුවක් පෙරළීයාමෙන් සිදු වූ අනතුරෙන් මියගිය එක් අයෙකු වෙනුවෙන් රුපියල් 100,000/-ක් බැගින් සහ තුවාල ලැබූ පුද්ගලයෙකු වෙනුවෙන් රුපියල් 20,000/- බැගින් වන්දි පිරිනැමීම පිණිස ආපදා කළමනාකරණ අමාත්‍ය අනුර ප්‍රියදර්ශන යාපා මැතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

2017/2/22

එම්. පී. ජයතිස්ස
ප්‍රවෘත්ති අධ්‍යක්ෂ
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
163, කිරුළපන මාවත,
කොළඹ 05.